මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: ITM/03/04/08
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.08.26

තොරතුරු තාක්ෂණ කළමනාකරණ චක්‍රලේඛ අංක : 01/2024

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ප්‍රධානීන් හා රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**රාජ්‍ය සේවාවන්හි කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා රජයේ තොරතුරු තාක්ෂණ පද්ධතිවලට අදාළ පරිදි ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය / සමාගම් ලියාපදිංචි අංකය ඇතුලත් කිරීම අනිවාර්ය කිරීම**

රාජ්‍ය සේවාවන්හි කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා රජයේ තොරතුරු තාක්ෂණ පද්ධතිවලට අදාළ පරිදි ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය / සමාගම් ලියාපදිංචි අංකය ඇතුලත් කිරීම අනිවාර්ය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2024.07.24 දිනැති අංක: 24/1488/604/161 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2024 අගෝස්තු මස 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබී ඇත.

02. ඒ අනුව, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළු සියළුම රාජ්‍ය ආයතන තුල දැනට භාවිතයේ ඇති සහ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත සියළුම තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා දත්ත ඇතුලත් කිරීමේදී පුද්ගල / ආයතන අනන්‍යතාවය හඳුනා ගැනීම සඳහා පහත I සිට III දක්වා සඳහන් තොරතුරු ඇතුලත් කිරීම අනිවාර්ය වන පරිදි,

- දැනට පවත්නා දත්ත පද්ධති ඒ අනුව අවශ්‍ය පරිදි සංවර්ධනය කිරීමට ද,
- ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත දත්ත පද්ධති ඒ අනුව සැලසුම් කර සංවර්ධනය කිරීමට ද,

කටයුතු කල යුතුය.

I. **ශ්‍රී ලාංකික පුරවැසිභාවය / ද්විත්ව පුරවැසිභාවය හිමි පුද්ගලයන්ගේ** (ශ්‍රී ලංකාවේ පදිංචි / ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි) අනන්‍යතාවය හඳුනා ගැනීම සඳහා **ජාතික හැඳුනුම්පත් අංකය*** ඇතුලත් කිරීම අනිවාර්ය වේ.

II. විදේශීය පුරවැසියන්ගේ අනන්‍යතාව හඳුනා ගැනීම සඳහා **විදේශ ගමන් බලපත්‍ර අංකය (Passport Number)** සමඟ **ජාතිකත්වය (Nationality)** ඇතුලත් කිරීම අනිවාර්ය වේ.

III. ආයතනයක් හඳුනා ගැනීම සඳහා **සමාගම් / ව්‍යාපාර ලියාපදිංචි අංකය** සමඟ එම ආයතනවල හිමිකරුවන්ගේ / අධ්‍යක්ෂ මණ්ඩලවල **සාමාජිකයන්ගේ** ඉහත කාණ්ඩ අංක I ට ඇතුළත් පුද්ගලයන්ගේ **ජාතික හැඳුනුම්පත් අංක** ද කාණ්ඩ අංක II ට ඇතුළත් පුද්ගලයන්ගේ **විදේශ ගමන් බලපත්‍ර අංක (Passport Number)** සමඟ **ජාතිකත්වය (Nationality)** ද ඇතුලත් කිරීම අනිවාර්ය වේ.

[*ජාතික හැඳුනුම්පත් අංකය යන්නෙන් වර්තමානයේ භාවිතා වන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත් අංකය හෝ ඒ වෙනුවෙන් ඉදිරියේදී හඳුන්වා දීමට නියමිත ජාතික හැඳුනුම්පත් අංකයක් ද නිර්වචනය වේ.]

03. දැනට භාවිතා කරනු ලබන තොරතුරු තාක්ෂණ පද්ධති මෙන්ම සංවර්ධනය කරමින් පවතින හෝ සැලසුම් කර ඇති තොරතුරු තාක්ෂණ පද්ධති ද ඉහත 02හි සඳහන් කර ඇති කොන්දේසි සපුරාලන පරිදි 2025 වර්ෂය තුළ සංවර්ධනය කිරීමට කටයුතු කිරීමටත් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන **2024.08.12 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 02/2024 හි 03.1(i) ඕ** වගන්තියේ සඳහන් පරිදි 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවට සහ මධ්‍යකාලීන අයවැය රාමුව තුල 2026 හා 2027 වර්ෂයන් සඳහා ඇතුලත් කර ගැනීමටත් සියළුම ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

04. තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා මෙම දත්ත ඇතුලත් කිරීම හා පවත්වාගෙන යාම **2022 අංක 09 දරණ දත්ත ආරක්ෂණ පනතේ** සඳහන් විධිවිධාන පරිදි සහ තාක්ෂණ අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති **2023.09.21 දිනැති MOT/2023/02 දරණ චක්‍රලේඛය** මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි සිදු කිරීමටත් එම දත්ත විධිමත් පරිදි අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ හුවමාරු කිරීමට හැකි වන **පරිදි දත්ත ප්‍රමිතිකරණය (Data Standardization)** කිරීමටත් සියළුම ආයතන ප්‍රධානීන් කටයුතු කල යුතුය.

05. ඉහත 02හි සඳහන් පරිදි ඔබ ආයතනයේ තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීමට පෙර මාර්ගගතව දත්ත හුවමාරු කරගැනීම පිළිබඳව සම්බන්ධීකරණ කටයුතු සඳහා අදාල දෙපාර්තමේන්තුවල පහත සඳහන් නිලධාරීන් සම්බන්ධ කර ගත යුතුය.

| අනු අංකය | ආයතනය | තනතුර | දුරකතන අංකය |
|---|---|---|---|
| 1 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන) | 011 522 6104 |
| | | කොමසාරිස් ( තොරතුරු තාක්ෂණ) | 011 522 6127 |
| 2 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | පාලක (තොරතුරු තාක්ෂණ) | 011 210 1530 |
| | | සහකාර පාලක (තොරතුරු තාක්ෂණ) | 011 277 7531 |
| 3 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් | 011 268 9206 |
| | | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 011 268 9870 |
| 4 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් | 011 288 9540 |
| | | සහකාර අධ්‍යක්ෂ(තොරතුරු තාක්ෂණ) | 011 288 9518 |

06. මෙම චක්‍රලේඛය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත නිකුත් කෙරේ.

07. මෙම චක්‍රලේඛය සම්බන්ධව වැඩිදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් **0112484763** දුරකතන අංකය මඟින් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ **අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රතිපත්ති හා සංවර්ධන)** හෝ **0112034531** දුරකතන අංකය මඟින් **අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සංවර්ධන)** අමතන්නේ නම් මැනවි.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පිටපත්: 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. අමාත්‍ය මණ්ඩල ලේකම්
04. විගණකාධිපති
05. ලේකම්, මුදල් කොමිෂන් සභාව

අමාත්‍ය මණ්ඩල තීරණය

2022 අංක 9 දරන දත්ත ආරක්ෂණ පනත

අයවැය කැදවීම 2025

MoT/2023/02 චක්‍රලේඛය

ඇමුණුම

අංක 01/2024 දරණ තොරතුරු තාක්ෂණ කළමනාකරණ චක්‍රලේඛයෙහි ඡේද අංක 05 සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා සම්බන්ධ කර ගත හැකි නිලධාරීන්ගේ ජංගම දුරකතන අංක ඔබගේ පහසුව සඳහා පහත දක්වා ඇත.

| අනු අංකය | ආයතනය | නම | තනතුර | දුරකතන අංකය |
|---|---|---|---|---|
| 1 | පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | එස්.ජ්.ර්.ඩබ්. කුලරත්න මිය | කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන) | 077 337 4712 |
| | | එම්.ර්. වීරසිංහ මිය | කොමසාරිස් (තොරතුරු තාක්ෂණ) | 071 254 1440 |
| 2 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | එච්.එම්.අයි.කේ. හේරත් මහතා | පාලක (තොරතුරු තාක්ෂණ) | 071 670 0934 |
| | | ජේ. එම්. එන්. එන්. සෙනෙවිරත්න මිය | සහකාර පාලක (තොරතුරු තාක්ෂණ) | 071 397 2510 |
| 3 | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | තරංග පණ්ඩිත මහතා | නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් | 077 372 8855 |
| | | කීර්ති සිරිවර්ධන මහතා | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 071 482 4873 |
| 4 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | ලක්ෂිකා ගනේපොල මිය | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් | 077 753 7952 |
| | | ජී. අමරසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 071 650 0184 |

චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පහත නිලධාරීන් සම්බන්ධ කර ගත හැක.

| අනු අංකය | නම | තනතුර | දුරකතන අංකය |
|---|---|---|---|
| 1 | උදේෂ් සෙනෙවිරත්න මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( ප්‍රතිපත්ති හා සංවර්ධන) | 071 489 9629 |
| 2 | චතුරි සෙනෙවිරත්න මිය | අධ්‍යක්ෂ ( ප්‍රතිපත්ති හා සංවර්ධන) | 076 608 3667 |